# ගංවතුරින් පීඩාවට පත් ජනතාවට සහන සැළසූ විදේශගත ශ්‍රී ලාංකික වෛද්‍ය වෘත්තිකයන් විදේශ කටයුතු අමාත්‍යාංශයේදී ඇගයීමට පාත්‍ර වේ.

ගෝලීය දෙමළ සංසදයට අයත් ශ්‍රී ලාංකීය සම්භවයක් සහිත වෛද්‍ය වෘත්තිකයන් 17 දෙනෙක් හා සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරයේ සහයෝගීතාවයෙන්, ලාංකීය වෛද්‍යවරුන් සමඟ එක්ව ජූලි මස 02 වෙනිදා සිට 06 වෙනිදා දක්වා කළුතර දිස්ත්‍රික්කයේත්, ජූලි මස 07 වෙනිදා සිට 10 වෙනිදා දක්වා මාතර දිස්ත්‍රික්කයේ ගම්වල හා ගංවතුර සහන කඳවුරුවල වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. විදේශගත ශ්‍රී ලාංකීය වෛද්‍යවරුන් එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, නොර්වේ, අමෙරිකා එක්සත් ජනපදය, ප්‍රංශය, බහරේන් සහ ජර්මනිය යන රටවලින් පැමිණියහ. දින 10 ක කාලය තුළ රෝගීන් 780 දෙනෙකුට වෛද්‍ය, දන්ත සහ අක්ෂි ප්‍රතිකාර ලබාදුනි. මේ අතරට ළමා නිවාසයක් සහ අනාථ මඩමක් ද අයත් විය. මෙහිදී වෛද්‍යවරුන් විසින් ඇස් හා අව් කණ්ණාඩි කුට්ටම් 300 ක් ද පරිත්‍යාග කරන ලදී.

ගංවතුරින් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා ස්වේච්ඡාවෙන් කටයුතු කළ ගෝලීය දෙමළ සංසදයේ වෛද්‍ය කණ්ඩායම සහ සර්වෝදය ව්‍යාපාරයේ සාමාජිකයන් ඇගයීමේ උත්සවයක් ජූලි 11 වෙනිදා විදේශ කටයුතු අමාත්‍යාංශයේදී පැවැත්විණ. ඊට විදේශ කටයුතු අමාත්‍ය රවි කරුණානායක සමඟ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික අමාත්‍ය ඩී.එම්. ස්වාමිනාදන්, විපක්ෂ නායක ආර්. සම්පන්දන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. ඒ. සුමන්තිරන් එක්ව සිටියහ.

ඕස්ට්‍රේලියාව, කැනඩාව, ඉන්දියාව, මැලේසියාව, නොර්වේ, එක්සත් රාජධානිය, අමෙරිකා එක්සත් ජනපදය, දකුණු අප්‍රිකාව සහ ස්විට්සර්ලන්තය යන රටවල තානාපති කාර්ය මණ්ඩල නිලධාරීන් මෙන් ම එක්සත් ජනපද ආධාර සාමාජිකයන් ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

ලොව නන්දෙසින් මෙහි පැමිණි වෛද්‍ය කණ්ඩායමට ගංවතුරින් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම පිළිබඳව අමාත්‍ය රවි කරුණානායක මහතා මෙම උත්සව අවස්ථාවේදී සිය කෘතවේදීත්වය පුද කළ අතර, ශ්‍රී ලාංකීය ජනවර්ග අතර සහයෝගීතාව ගොඩනැංවීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ස්තූතිය පළ කලේය. මෙරට සමාජ සත්කාර හා සංහිඳියා ක්‍රියාවලියේ නිරතුරුව පෙරමුණ ගෙන කටයුතු කරන, ඉමහත් පරිශ්‍රමයෙන් ජනවර්ග එකමුතු කිරීමේ කාර්යයෙහි නියැළෙන සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය ද මෙහිදී අමාත්‍යවරයාගේ නොමඳ පැසසුමට ලක්විය. ඉහත සමාජ සත්කාර සඳහා නොර්වේ සහ ස්විට්සර්ලන්ත රජයන් මෙන්ම යුනිසෙෆ් සංවිධානය දැක්වූ සහාය ද අමාත්‍යවරයා අගය කලේය. වෛද්‍ය සභාවේ රෙගුලාසිවලට අනුකූලව වෛද්‍යවරුන්ට නිසි පරිදි කටයුතු කිරීමට අවශ්‍ය වාතාවරණය සළසමින්, කෙටි දැනුම්දීමකින් මෙම වැඩසටහනට සහාය දැක්වීම නිමිත්තෙන් සෞඛ්‍ය අමාත්‍ය රාජිත සේනාරත්නට ද, විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් හට ද ඔහු මෙහිදී සිය ස්තූතිය පළ කර සිටියේය.

විදෙස්ගතව සිටින ශ්‍රී ලාංකීය සම්භවයක් සහිත පුද්ගලයින් මෙරට ජනතාව සහ රජය සමඟ එක්ව මෙවන් වැදගත් ව්‍යාපෘතියකට මුලපිරීමට උනන්දු කරවීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා ගෝලීය දෙමළ සංසදයට ස්තූතිය පළ කළ අතර, සාමය, ස්ථාවරභාවය සහ සංවර්ධනය කරා යන ගමනේදී පාර්ශ්වකරුවන් ලෙස කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරන බව ද ප්‍රකාශ කලේය. "සැතපුම් දහසක ගමනක් ආරම්භ වන්නේ එක් කුඩා පියවරකිනි" යන චීන ආප්තෝපදේශය සිහිගන්වමින් අමාත්‍ය රවි කරුණානායක සඳහන් කලේ මේ ව්‍යාපෘතිය හරහා තැබූ පියවර විදේශීය රටවල සිටින ශ්‍රී ලාංකිකයන් හා සමඟ රටේ තිරසර සාමය හා ආර්ථික වර්ධනය අත්පත් කරගැනීමේ ප්‍රමුඛ ක්‍රියාවලියේ පළමු අඩියර වනු ඇති බවයි.

විදේශ කටයුතු අමාත්‍යාංශය
කොළඹ

2017 ජූලි 14